Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ඇබෑර්තු

**ආරක්ෂක නිලධාරි තනතුර**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින "**ආරක්ෂක නිලධාරි**" තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් **2021 අගෝස්තු මස 06 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන සේ "**පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් විය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**ආරක්ෂක නිලධාරි**" යනුවෙන් සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.Parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය.)

1. **වැටුප් පරිමාණය :**

   2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 28,250 - 9 x 300/10 x 330 x 380 - 35,390 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 62,000.00 පමණ වේ)

2. **අධ්‍යාපන සුදුසුකම් :**

   සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම.

   සහ

   වසර 10කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකු වීම.

3. **වයස් සීමාව :**

   අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

4. **බඳවා ගැනීමේ ක්‍රමය :**

   ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5. සේවා නියමයන් හා කොන්දේසි :

   (i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

   (ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

   (iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාශණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය.
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඇ) වෘත්තීමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා එවිය යුතුය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යම් අයදුම්කරුවෙකු තෝරාගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අදාළ ආයතන/දෙපාර්තමේන්තු/ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2021 ජූලි මස 16 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

ආදර්ශ අයදුම් පත්‍රය

**ආරක්ෂක නිලධාරි තනතුර**

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..........................................................................
..........................................................................
..........................................................................

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ..........................................................................
..........................................................................
..........................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (*Mr/Mrs/Miss*) ..........................................................................
..........................................................................
..........................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය : ..............................................................................

..............................................................................

..............................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ආ) කාර්යාලයීය ලිපිනය : ..............................................................................

..............................................................................

..............................................................................

දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය

පෞද්ගලික : ☐ කාර්යාලයීය : ☐

04. (අ) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

05. විවාහක/අවිවාහක බව : (විවාහක/අවිවාහක)

06. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී/පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/නැත)

08. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් ඇමිණිය යුතුය)

| *විභාගය* | *විෂයය* | *සාමාර්ථයන්* | *සමත්වූ වර්ෂය* |
|---|---|---|---|
| අ.පො.ස. (සා/පෙළ) | සිංහල/දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. වෙනත් සුදුසුකම් : (පිටපත් ඇමිණිය යුතුය)

..............................................................................

..............................................................................

..............................................................................

10. පළපුරුද්ද : (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

| *ආයතනය/දෙපාර්තමේන්තු* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :

(අ) ආයතනයේ නම හා ලිපිනය : .......................................................................................................

(ආ) මුල් පත්වීමේ දිනය : .......................................................................................................

(ඇ) දැනට දරන තනතුර : .......................................................................................................

(ඈ) මාසික මූලික වැටුප : .......................................................................................................

(ඉ) දීමනා : .......................................................................................................

(ඊ) දළ වැටුප : .......................................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :
.......................................................................................................................................

ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතු වන බව දනිමි.

.........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .....................................

### ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
### (සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි.)

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

ශ්‍රී ලංකා යුධ/ගුවන්/නාවික හමුදාවේ/පොලිසියේ ..................................................................තනතුර දරන ............................................ ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට එරෙහි විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක.

.........................................................,
ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය : .....................................